
# 7. යහපත් පුරවැසියකු වශයෙන් සමාජයේ ජීවත් වීමට අවශ්‍ය ගුණාංග

ඕනෑ ම රටක් හෝ සමාජයක් දියුණුව කරා පිය නගන්නේ එම සමාජයේ ජීවත්වන යහපත් පුරවැසියන්ගේ දායකත්වය හේතුවෙනි. යහපත් පුරවැසියෙකු ලෙස සමාජයේ ජීවත්වීම සඳහා ප්‍රගුණ කළයුතු ගුණාංග රාශියකි. අවට පරිසරය මෙන් ම පොදු දේපළ සුරැකීම, දේශීය දේ අගය කිරීම, සමාජ සම්ප්‍රදායයන් හා නීති රීති ගරු කිරීම ඒවායින් සමහරක් වේ. මෙම ගුණාංග ප්‍රගුණ කරමින් යහපත් පුරවැසියෙකු ලෙස රටට සේවය කිරීම අප සියලු දෙනාගේ ම වගකීමකි.


## 7.1.1 පරිසර සංරක්ෂණය

**සැළලිහිණි කොවුල් හඬ රැව් දෙන්නා මහ උයනක සිරි ඉතිරේ.**
***මෙම ගීතය ගායනා කරන්න.***



මෙම ගීතය ගායනා කරන විට එහි දැක්වෙන ගස්වැල්, සතුන් ගංගා, දියඇලි පිළිබඳ ව අප මනසේ ඇඳෙන සිතුවම කොතරම් චමත්කාරජනක ද? එහි සිසිල අපට දැනෙන්නාක් මෙනි. එවන් පරිසරයක ජීවත් වීමට අපි සියලු දෙනා ම කැමැති වෙමු.

**පරිසරය යනු අප අවට ඇති වටපිටාවයි. සොබා දහමෙන් ලත් උරුමයයි.**




අප වටපිටාවේ ඇති කඳුවැටි, ගහකොළ, දියඇලි, ගංගා, සතා සිවුපාවුන් මෙන් ම අපි ද පරිසරයේ කොටස්කරුවෝ වෙමු. පරිසරය හා අප අතර ඇත්තේ වෙන් කළ නොහැකි අන්‍යෝන්‍ය සම්බන්ධතාවකි.

මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පරිසරය විවිධ අයුරින් යොදා ගැනේ. එහි දී පරිසරය පරිහරණය කිරීමට සිදු වේ.

**මේ නිසා අනාගත පරපුරට ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට අද අපි පරිසරය පරිහරණය කළ යුතු වෙමු.**

මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරය විනාශ වී යාමෙන් ජීවීන්ගේ පැවැත්මට සුදුසු පරිසරයක් පවත්වා ගෙන යාමේ අභියෝගයට අද අපි මුහුණ දී සිටිමු. මේ සඳහා අපි සියලු දෙනා ම සක්‍රීය ලෙස පරිසර සංරක්ෂණයට දායක විය යුතු වෙමු.

**"සංරක්ෂණය යනු පවතින සම්පත් පරිහරණය කරමින් අනාගතය සඳහා ඉතිරි කිරීමයි. මේ නිසා අනාගත පරපුරට ප්‍රයෝජන ගත හැකි ආකාරයට අද අපි පරිසරය පරිහරණය කරමු."**

### ක්‍රියාකාරකම 7.1.1.1


- වනගත පරිසරයක ක්ෂේත්‍ර චාරිකාවක යෙදී එහි දී ඔබ විඳි අත්දැකීම් පිළිබඳ වාර්තාවක් සකස් කර පරිසර සමිතියට ඉදිරිපත් කරන්න..
- පහත වගුව සම්පූර්ණ කරන්න.

| පරිසරයෙන් අප ලබා ගන්නා දේ | පරිසරයට අප ලබා දෙන දේ |
|---|---|
| | |



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

## පරිසරය දූෂණය වන ක්‍රම




* ජල දූෂණය - ජලයට අපවිත්‍ර ද්‍රව්‍ය මුදාහැරීමෙන්
* වායු දූෂණය - අහිතකර වායු වාතයට මුසුවීමෙන්
* ශබ්ද දූෂණය - කර්මාන්තශාලා හා වාහනවල ශබ්ද මගින්
* සංස්කෘතික දූෂණය - විශ්ව ගම්මාන සංකල්පය තුළ බහු සංස්කෘතික බලපෑමකට ලක් ව සාරධර්ම පිරිහී යාමෙන්

**ක්‍රියාකාරකම 7.1.1.2**

| පරිසර දූෂණය වන ක්‍රම | වළක්වා ගත හැකි ක්‍රම/අවම කර ගත හැකි ආකාරය |
|---|---|
| උදා:- ජලය | |

වාතය, ජලය හා පස මිනිස් ක්‍රියාකාරකම් නිසා දූෂණය වීම හේතුවෙන් අපට මුහුණ දීමට සිදු වී ඇති අහිතකර තත්ත්ව කිහිපයක් මෙසේ ය.

* පානීය ජලය හිඟ වීම
* ජල උල්පත් සිඳී යාම
* පස සෝදා යාම හා නිසරු වීම
* කාන්තාරකරණය
* වායු දූෂණය
* දූපත් මුහුදු ජලයෙන් යට වීම
* ජෛව විවිධත්වයට හානි පැමිණීම
* ගංවතුර, නියඟය හා නායයෑම් ඇති වීම
* වසංගත රෝග ව්‍යාප්ත වීම
* ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම

**පරිසර දූෂණය අවම කරමින් මානව සංහතියේ පැවැත්ම සඳහා සමස්ත මානව වර්ගයා ම දායක විය යුතු ය.**

**ක්‍රියාකාරකම 7.1.1.3**

* පරිසර දූෂණය අවම කර ගැනීමට හෝ වළක්වා ගැනීමට මිනිසාට දායක විය හැකි ය/ නොහැකි ය යන මාතෘකාව යටතේ විවාදයක් සංවිධානය කරන්න.
* ක්‍රමවත් ලෙස කැළි කසළ ඉවත් නොකිරීම නිසා සිදුවන පාරිසරික ගැටලු හා ඒවාට විසඳුම් ලැයිස්තුවක් සකස් කරන්න.
* පරිසර දූෂණය වැළැක්වීමට හෝ අවම කර ගැනීම සඳහා ඔබ ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම සඳහා පරිසර දිනයට අදාළ ව පෝස්ටර් ප්‍රදර්ශනයක් සංවිධානය කරන්න.

**පරිසර දූෂණය අවම කරමින් මානව සංහතියේ පැවැත්ම සඳහා ආත්මාවබෝධයෙන් යුතු ව කටයුතු කිරීම සැබෑ පුරවැසියකු සතු ප්‍රධාන යුතුකම මෙන් ම වගකීම ද වේ.**

## 7.1.2 පොදු දේපළ සුරැකීම

**රටක පවතින පොදුවේ සියලු දෙනාට ම ප්‍රයෝජනයට ගත හැකි සියලු ම භාණ්ඩ, සේවා සහ ස්ථාන පොදු දේපළ ලෙස සැලකේ.**

### පොදු දේපළ සඳහා උදහරණ

- පාසල සහ පාසල්වල උපකරණ
- මහා මාර්ගය
- පුස්තකාලය
- රෝහල් හා ඒවා සතු උපකරණ
- බස් නැවතුම් පළ
- පොදු ප්‍රවාහන සේවා

**පොදු දේපළ අප සැම ප්‍රයෝජනයට ගන්නා බැවින් ඒවාට හානි නොකර පරිහරණය කළ යුතු ය.**

පාසල පොදු දේපළකි. පාසලේ පන්තිකාමර, ඩෙස් පුටු, ක්‍රීඩා භාණ්ඩ ආදිය ප්‍රයෝජනයට ගත යුත්තේ ඒවාට හානි නො වන ආකාරයෙනි. ආදි සිසුන් සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළ නිසා ඒවා ඔබට අද භුක්ති විඳීමට ඉඩ ලැබී තිබේ. එම නිසා අනාගතයේ පාසලට පැමිණෙන ඔබේ සහෝදර සහෝදරියන්ට ද මෙම සම්පත් ප්‍රයෝජනයට ගත හැකි පරිදි ඒවා භාවිත කිරීම ඔබ සතු යුතුකමකි.

**ක්‍රියාකාරකම 7.1.2.1**

- ඔබට පාසලේ දී පොදු දේපළ සුරැකීමට දායක විය හැකි ආකාරය සාකච්ඡා කරන්න.
- ඔබ ජීවත් වන සමාජයේ දී ඔබට භුක්ති විඳීමට ලැබෙන පොදු දේපළ පිළිබඳ පහත වගුව සම්පූර්ණ කරන්න.

| පොදු දේපළ | ලැබෙන ප්‍රයෝජන | ආරක්ෂාකාරී ලෙස භාවිත කරන ආකාරය |
|---|---|---|
| | | |

## 7.1.3 දේශීය දේ අගය කිරීම

අපි ශ්‍රී ලාංකිකයෝ වෙමු. ශ්‍රී ලංකාව අපේ රටයි. අපි කීර්තිමත් ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියමු. දියුණු වාරි තාක්ෂණය, අපූරු කලා නිර්මාණ හා ඉදිකිරීම් අපගේ මුතුන් මිත්තන්ගේ නිර්මාණශීලී හැකියාව විදහා දක්වයි. අතීතයේ පැවති ඉසුරුමත් බව වර්තමානයේ දී ගොඩනැගීමට හා පවත්වාගෙන යාමට නම් අප දේශීය දේ අගය කිරීමටත්, ඒවා සංරක්ෂණය කිරීමටත් පුරුදු පුහුණු විය යුතු ය.



**අපේ වෙදකම, අපේ නිෂ්පාදන, අපේ කර්මාන්ත රැක ගැනීම අපේ යුතුකම හා වගකීමයි.**

*අපේ අසල්වැසි ඉන්දියාවේ මහත්මා ගාන්ධිතුමා ඉන්දියාවේ නිෂ්පාදනය කරන ලද රෙදිපිළි හා භාණ්ඩ පමණක් භාවිත කරමින් ඉන්දියානු කර්මාන්ත හා නිෂ්පාදන ජනප්‍රිය කිරීමට උත්සාහ දැරුවේ ය.*

- අපේ ඖෂධ පැළෑටි සංරක්ෂණය, ආයුර්වේද දින චරියාව අනුගමනය කිරීම ආදි ක්‍රියාමාර්ග මගින් අපි දේශීය දේ අගය කිරීමට පුරුදු පුහුණු කරමු.
- දේශීය කලාශිල්ප හා සාහිත්‍යය, රසවින්දනය කිරීමට හුරු පුරුදු වෙමු.

**ක්‍රියාකාරකම 7.1.3.1**

- ශ්‍රී ලංකාවේ නිපදවන ඔබ භාවිත කරන භාණ්ඩ පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න.
- ඔබ ප්‍රදේශයේ දේශීය වෛද්‍යවරයකු හෝ ප්‍රජා සෞඛ්‍ය නිලධාරියකු මගින් දේශීය වෛද්‍ය ක්‍රම භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳ වැඩසටහනක් ගුරුතුමා/ගුරුතුමිය සමග එක් වී සංවිධානය කරන්න.



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

## 7.1.4 ආචාරශීලී භාෂා භාවිතය

අපි භාෂාව මගින් අදහස් හුවමාරු කරමු. එහි දී සුහදශීලී හා ප්‍රියමනාප ලෙස කතා බස් කිරීමෙන් අපගේ උවමනාවන් ඉටුකර ගැනීමට හැකියාව ලැබේ. යහපත් පුරවැසියෙක් හැම විට ම අන් අය සමඟ අදහස් හුවමාරුවේ දී ආචාරශීලි භාෂාව භාවිත කරයි. ආචාරශීලී ලෙස භාෂාව භාවිත කිරීමෙන් පුද්ගලයන් අතර ගැටුම් අවම වෙයි.

ආචාරශීලී ලෙස භාෂාව භාවිත කිරීමේ දී පහත සඳහන් ගුණාංග දක්නට ලැබේ.

- කරුණාවන්ත හා ඉවසිලිවන්ත බව
- සුදුසු අවස්ථාවල දී අවසර ලබා ගැනීම
- සංයමය හා විනයානුකූල බව
- ස්තුතිවන්ත වීම
- වරදක දී, අතපසුවීමක දී හා බාධාවක දී සමාව අයදීම
- පුද්ගලයන් සමග අදහස් හුවමාරුවේ දී ගෞරවාන්විත ලෙස කතා කිරීම
- සුබ පැතීම
- අගය කිරීම හා ප්‍රශංසා කිරීම
- සරල හා පැහැදිලි වචන භාවිතය
- භාෂාව නිවැරදි ව හා ක්‍රමවත් ව හැසිරවීම
- ක්‍රමානුකූල ව හා අවස්ථාවට සුදුසු පරිදි හඬ හා වචන භාවිත කිරීම

**දක්ෂ කථිකයා වාචාලයකු නො වේ**

**ක්‍රියාකාරකම 7.1.4.1**

- පන්ති කාමරය තුළ ඔබ කැමති තේමාවක් ඔස්සේ දෙබස් සහිත රඟ දැක්වීමක් ඉදිරිපත් කරන්න.

  උදා:- ආගමික පූජකවරයෙකු සමග සිදු කරන සංවාදයක්

## 7.1.5 සම්පත් අරපිරිමැස්මෙන් යුතු ව භාවිතය

කුඩා කල සිට ම ඔබ විවිධ සම්පත් භාවිත කරයි. ඔබේ පොත්පත්, ඇඳුම් පැළඳුම්, ක්‍රීඩා භාණ්ඩ ඒ අතර වේ. පාසලේ දී ද නිවසේ දී ද ඔබ බොහෝ උපකරණ, බලශක්තිය, ජලය වැනි සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ දී අරපිරිමැස්මෙන් යුතුව කටයුතු කළ යුතු ය.





**අද දින සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කරන විට හෙට දිනයේ දී ඒවා ප්‍රයෝජනයට ගත හැකි ය.**

**ක්‍රියාකාරකම 7.1.5.1**

- පහත වගුව සම්පූර්ණ කරන්න.

| සම්පත් | අරපිරිමැස්මෙන් භාවිත කළහැකි ආකාරය |
|---|---|
| ජලය | |
| විදුලිය | |
| දර/ගෑස් | |
| ගෙවත්ත/පාසල් භූමිය | |
| පොත්පත් | |



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

## 7.1.6 විනය හා ශික්ෂණය

**නීති රීති, සිරිත් විරිත් හා ආගමික සාරධර්ම වැනි සමාජ අගයයන් අපගේ විනය හා ශික්ෂණය හැඩ ගැස්වීමට ඉවහල් වේ.**

ඔබ සහභාගී වන අවස්ථාව, ස්ථානය, අරමුණ අනුව ඔබේ හැසිරීම් රටාව එකිනෙකට වෙනස් වේ. සමාජයේ යහපත් ලෙස පිළිගත් හැසිරීමට විරුද්ධ ව ඔබ ක්‍රියා කළහොත් සමාජ විරෝධී පුද්ගලයකු බවට පත් වේ. එවිට ඔබේ කීර්තිනාමයට හානි සිදුවන අතර ඇතැම් අවස්ථාවල දඬුවම් ලැබීමට ද සිදු වේ.

**පවුල, පාසල හා සමාජය ඔබෙන් අපේක්ෂා කරන හැසිරීම් රටාව විනයයි.**

**ක්‍රියාකාරකම 7.1.6.1**

- ඔබ හඳුනාගත් විනය විරෝධී අවස්ථා ලැයිස්තුගත කරන්න.
- විනයානුකූල පුද්ගලයකු සතු ගුණාංග පහක් නම් කරන්න.
- මනා ශික්ෂණයක්, විනයක් පවත්වාගෙන යාමේ වැදගත්කම් පහක් ලියන්න.

## 7.1.7 අන්මත ඉවසීම හා සාකච්ඡා මගින් නිවැරැදි තීරණයන්ට එළඹීම

සමාජය තුළ විවිධ තරාතිරම්වලට අයත් කණ්ඩායම් ජීවත් වෙති. පොදු සමාජ අවශ්‍යතාවන් ඉටු කර ගැනීමේ දී, අදහස් ප්‍රකාශ කිරීමේ දී හා ගැටලු නිරාකරණය කිරීමේ දී පොදු එකඟතාවකට පැමිණිය යුතු අවස්ථා උදා වේ. ඒ සඳහා පහත සඳහන් ගුණාංග ප්‍රගුණ කිරීම අවශ්‍ය වේ.

- අන් අයගේ අදහස් තමා දරන අදහසට විරුද්ධ වුවත් ඒවාට සවන් දීම හා බාධා නොකිරීම.
- පොදු එකඟතාවකට එළඹීමට උත්සාහ දැරීම.
- වැඩි දෙනකුට එකඟවිය හැකි පරිදි සාකච්ඡා මගින් ගැටලු විසඳීමට යොමු වීම.
- අපක්ෂපාතී, සාධාරණ හා මධ්‍යස්ථ තීරණ ගැනීම.

**ක්‍රියාකාරකම 7.1.7.1**

- අන්‍යයන්ගේ මත ඉවසීමේ වැදගත්කම ප්‍රකාශිත කරුණු පහක් ලියන්න.

## 7.1.8 සමාජයේ සරු දේ සරු ලෙස පිළිගැනීම හා නිසරු දේ නිසරු ලෙස පිළිගෙන ප්‍රතික්ෂේප කිරීම

සමාජයේ හොඳ සහ නරක දෙකම පවතී. හොඳ අදහස් ගතිගුණ තෝරා බේරාගෙන ඒවා අනුගමනය කිරීමෙන් වැරදි සහ නරක දේ තමා තුළිනුත් සමාජයෙනුත් බැහැර කිරීමට ක්‍රියා කළ යුතුයි. ආගමික ඉගැන්වීම් ඒ සඳහා ඔබට ප්‍රයෝජනවත් වේ.

ඔබේ මුළුතැන්ගෙය තුළ තිබෙන කුල්ල ගැන සිතන්න. දහයියා, රොඩු ඉවත් කර පිරිසිදු සහල් පමණක් ලබා ගැනීමට කුල්ල උපකාරී වේ. ඉවත් කළ යුතු දේ ඉවත් කරමින් තබාගත යුතු දේ සුරක්ෂිත ව පවත්වා ගත යුතු ය.


**හංසයා දියෙන් කිරි වෙන් කරගන්නා සේ ඔබත් නරක දෙයින් හොඳ දෙය තෝරා ගෙන ජීවිතය සාර්ථක කර ගත යුතුයි.**

පැහැදිලි ජීවන දර්ශනයක් (හරි දැක්මක්) ඇති විටෙක පුද්ගලයකුට සමාජයේ සරු දේ සරු ලෙස පිළිගනිමින් නිසරුදේ නිසරු ලෙස පිළිගෙන ප්‍රතික්ෂේප කිරීමේ හැකියාව ලැබේ. එසේ වීම තුළින් පුද්ගලයකුට ගෞරවණීය දිවිපැවැත්මකට උරුමකම් කිව හැකි ය.

**ක්‍රියාකාරකම 7.1.8.1**

- රූපවාහිනියේ විකාශය වන වැඩසටහන් අතරින් ඔබට නැරඹීමට සුදුසු වැඩසටහන් ලැයිස්තුවක් පිළියෙල කරන්න.
- ඔබට සිතෙන ආකාරයට සමාජය සතු සරු හා නිසරු දේවල් පහක් ලියා දක්වන්න. ඔබ එසේ ඒවා වර්ග කිරීමට හේතු ලියා දක්වන්න.


## 7.1.9 සමාජ සම්ප්‍රදායයන්ට හා නීතිරීතිවලට ගරු කිරීම



සමාජයක් තුළ දීර්ඝකාලීන ව පිළිගැනීමකට ලක් වූ හා අනුගමනය කරමින් පවතින දේ සම්ප්‍රදායයන් ලෙස හඳුන්වයි. අප සමාජය තුළ විවිධාකාර සිරිත් විරිත් ක්‍රියාත්මක වේ. සිරිත් යනු කළ යුතු දේ වන අතර විරිත් යනු වැළකිය යුතු දේ ය.

ජන සමාජයක ජීවත් වන සියලු දෙනා එහි යහ පැවැත්ම සඳහා දායක විය යුතු ය. රජයක් විසින් රට තුළ නීති රීති පනවනු ලබන්නේ ජනතාවට ආරක්ෂාව හා රැකවරණය ලබා දීමේ අපේක්ෂාවෙනි. එම නීති රීති තුළින් සමාජය විනයගරුක වීමක් සිදුවේ.

**සමාජයේ සාමයත් සතුටත් පවතින්නේ**
**එරට ජනතාව නීති පිළිපැදීමේ තරම මත ය.**




**ක්‍රියාකාරකම 7.1.9.1**

- ශ්‍රී ලාංකික සමාජය තුළ පවතින නීති රීති ඔබ හඳුනා ගෙන තිබේ ද? යහපත් පුරවැසියකු වශයෙන් ජීවත්වීමට එම නීති රීති කොතරම් දුරට වැදගත් වන්නේදැයි ඉතා කෙටියෙන් පැහැදිලි කරන්න.



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

## ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශය - 6 වන ශ්‍රේණිය
## නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය

| නිපුණතා හා නිපුණතා මට්ටම් | | විෂය සන්ධාරය |
|---|---|---|
| 1. | ආත්මාවබෝධයෙන් යුතු ව ගුණගරුක ව කටයුතු කරයි. | |
| 1.1 | තමා පිළිබඳ තොරතුරුවල අවශ්‍යතාව සහ ඒවායේ වැදගත්කම අධ්‍යයනය කරයි. | *තමා හඳුන්වාදීම *සෑම අයකු ම සතු දුබලතා හා ප්‍රබලතා * දුබලතා හා ප්‍රබලතා විනිශ්චය කිරීම * අරමුණු හඳුනා ගැනීම හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට ප්‍රබලතා බලපාන අයුරු * ප්‍රබලතා වැඩි දියුණු කර ගැනීමේ හා දුබලතා අවම කිරීමේ වැදගත් කම හා එසේ කළ හැකි අයුරු |
| 1.2 | ජීවිතය හා පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | * පවුල පිළිබඳ තොරතුරු* ජීවත් වන පරිසරය පිළිබඳ තොරතුරු * ජීවිතයේ අමතක නොවන සිදුවීම් * ජීවිතයේ සතුටුදායක අවස්ථා *ජීවිතයේ ශෝකජනක අවස්ථා * ජීවිතයේ දී උදව් කළ අය |
| 1.3 | තමාගේ හා අන් අයගේ වටිනාකම් හඳුනා-ගෙන ඒවාට ගරුකරමින් සහයෝගයෙන් කටයුතු කරයි. | * තමන් සතු ගුණදහම් හඳුනා ගැනීම * තමන්ට එම ගුණ දහම් හුරු වූ ආකාරය * විවිධ ගුණදහම්වලට ගරු කිරීම |
| 2. | මනා සැලසුමකින් හා සංවිධානාත්මක ව කටයුතු කරයි. | |
| 2.1 | ජීවිතයට අදාළ කටයුතු මනා සැලසුමකින් හා සංවිධානාත්මක ව ඉටු කරයි. | *එදිනෙදා කටයුතු සැලසුම් කිරීම හා සංවිධානය |
| 2.2 | ඵලදායි ලෙස විවේකය ගත කරයි. | * විවේකයේ අරුත හා එහි අවශ්‍යතාව * ඵලදායි ලෙස විවේකය ගත කිරීමේ උචිත විවිධ ක්‍රම උපක්‍රම |
| 3. | ඵලදායි සන්නිවේදනයේ යෙදෙයි. | |
| 3.1 | සක්‍රීය සවන් දීම හා නිවැරදි ව අදහස් ප්‍රකාශ කිරීමේ යෙදෙයි. | * සක්‍රීය සවන් දීම * මිත්‍රශීලීව කතාබස් කිරීම * නිරවුල් නිවරදි ව හා ක්‍රමවත් ව අදහස් ප්‍රකාශ කිරීම, අදහස් හුවමාරුවේ දී අදාළත්වය හා කාලය පිළිබඳ සැලකිලිමත් වීම |
| 3.2 | ඵලදායි සන්නිවේදනය මගින් යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි. | * අන්තර්පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගැනීමට ඵලදායී සන්නිවේදනයේ අවශ්‍යතාව * නිරවුල් සන්නිවේදනයක් නොමැති වූ විට පුද්ගලයන් තුළ අනවබෝධය ප්‍රදර්ශනය වීම * ඵලදායි සන්නිවේදනය තුළින් සහයෝගය, ගොඩ නැගෙන බව හා සංවර්ධනය වන බව |
| 4. | සහානුභූතියෙන් යුතු ව කටයුතු කරයි. (සහකම්පනය/අනුවේදනය) | |
| 4.1 | අන්‍යයන්ගේ අවශ්‍යතා තමාගේ අවශ්‍යතාවක් ලෙස දැක යහපත් ප්‍රතිචාර දක්වයි. | *අන්‍යයන්ගේ අවශ්‍යතාවලට හැඟීම්වලට සංවේදී වීම * පාසල හා පවුල තුළ යම් යම් කාර්යයන්වල දී සංවේදී ව කටයුතු කිරීම * විශේෂ අවශ්‍යතා ඇති අය සම්බන්ධයෙන් මානව දයාවෙන් කටයුතු කිරීම |
| 4.2 | පරිසරය, ජාතික හා සංස්කෘතික උරුම සුරැකීමට පෙලඹෙයි. | * පරිසරයට සංවේදී වීම * ජාතික හා සංස්කෘතික උරුම අභිමානයෙන් යුතුව සුරකියි |
| 4.3 | අධි සංවේදී නොවී කාර්යයන්හි නිරත වෙයි. | අධිසංවේදී නො වී කාර්යයන්හි නිරතවීම |
| 5. | ක්‍රියාශීලි සමාජිකයකු වශයෙන් පාසල් සමාජයේ සංවර්ධනයට දායක වේ. | |
| 5.1 | *පාසල් සමාජයේ සමාජිකයෙක් ලෙස තම වගකීම් හා යුතුකම් ඉටුකරයි.<br>*පාසල් සංස්කෘතිය තුළ පාසලේ පවත්නා නීතිරීති හා සම්ප්‍රදායන්ට අනුගත වේ. | * පාසලේ ආරම්භය හා විකාශය * සංවිධාන ව්‍යුහය * පාසල් සමාජය * පාසල් සංස්කෘතිය * පාසලේ අනන්‍යතාව * පාසල් සාමාජිකයන්ගේ වගකීම් හා යුතුකම් * පාසලෙන් සිදු වන සේවය * පාසල හා සමාජය අතර සබඳතා |
| 6 | ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් සමාජයේ යහපැවැත්මට දායක කර ගනියි. | |
| 6.1 | * තමා ජීවත් වන ප්‍රදේශයේ සම්පත් අගය කරමින් ඒවා සංරක්ෂණය කිරීමට කටයුතු කරයි.<br>* ප්‍රදේශවාසීන් සමග සමුහිකත්වයෙන් ජීවත් වීමට සූදානම ප්‍රදර්ශනය කරයි.<br>* විවිධ පුද්ගලයින් හා ආයතන තම දෛනික දිවි පැවැත්මට අවශ්‍ය බව තේරුම් ගෙන කටයුතු කරයි. | * පිහිටීම ග්‍රාම නිලධාරි කොට්ඨාසය, දිස්ත්‍රික්කය, පළාත * අප ප්‍රදේශයේ භෞතික හා මානව සම්පත් * ප්‍රදේශයේ ආර්ථික කටයුතු * ප්‍රදේශවාසීන් තුළ සාමුහිකත්වය කැපී පෙනෙන අවස්ථා * ප්‍රදේශයේ සිද්ධස්ථාන, සමිති සමාගම්, ආයතන හා මගින් ඉටු වන සේවා * අපට උදව් කරන පුද්ගලයන් හා සංවිධාන * ග්‍රාම නිලධාරි * සමෘද්ධි නිලධාරි * පවුල් සෞඛ්‍ය නිලධාරිනි * මහජන පරීක්ෂක * තැපැල් කරු * පොලිස් නිලධාරින් * ස්වේච්ඡා සංවිධාන |
| 7.0 | යහපත් පුරවැසියකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග | |
| 7.1 | යහපත් ගුණාංගවලින් හෙබි සාමාජිකයකු ලෙස ජන සමාජය තුළ කටයුතු කිරීමට සූදානම ප්‍රදර්ශනය කරයි. | |
| 7.2 | යහපත් පුරවැසියකු වශයෙන් සමාජයේ ජීවත්වීමට අවශ්‍ය ගුණාංග ප්‍රගුණ කරයි. | * පරිසර සංරක්ෂණය * පොදු දේපළ සුරැකීම * දේශීය දේ අගය කිරීම * ආචාරශීලී භාෂා භාවිතය * සම්පත් අරපිරිමැස්මෙන් යුතුව භාවිතය * විනය හා ශික්ෂණය * අන්මත ඉවසීම හා සාකච්ඡා මගින් නිවැරදි තීරණවලට එළඹීම * සමාජයේ සරු දේ සරු ලෙස පිළිගැනීම හා නිසරු දේ නිසරු ලෙස පිළිගෙන ප්‍රතික්ෂේප කිරීම * සමාජ සම්ප්‍රදායයන් හා නීතිරීති ගරු කිරීම |